# ශ්‍රී ලංකාවේ වාරි නිළධාරීන්ගේ පත්වීම

කේ.ඩී. නීලිකා ප්‍රියදර්ශනී

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
nilika1991@gmail.com

---

අහස් දියෙන් කරනු ලැබූ ගොවිතැන ප්‍රමාණවත් නොවූ කළ ශ්‍රී ලාංකිකයෝ ඊට පිළිතුරු සපයා ගත්තේ ගංගා ඇළ මාර්ග උපයෝගී කරගනිමින් කෘත්‍රිමව ජලය රැස්කර ගැනීමේ ක්‍රම හරහාය. ශ්‍රී ලාංකීය ඉතිහාසයේ විශේෂිත නිර්මාණයක් වූ වාරි නිමැවුම් කෘෂි ආර්ථිකය පෝෂණය කළ ප්‍රධාන සාධකයක් විය. ගම් වැවෙන් ඇරඹෙන වාරි නිර්මාණ ක්‍රමයෙන් මිනිස් අවශ්‍යතා මත මහා පරිමාණ වැව් දක්වා වර්ධනය වී තිබේ. මෙය සංකීර්ණ නිර්මාණ ක්‍රියාවලියක් වූ හෙයින් මේ හා බැඳෙන ශ්‍රමය ද අතිශය වැදගත් සාධකයක් වේ. වාරි නිර්මාණයන් විෂයයෙහි සුවිශේෂී නිළධාරීන් පිරිසක් වූ බවට පවතින අනුමානයන් හරහා යමින් පෞද්ගලිකව හෝ රාජ්‍ය මැදිහත්වීමෙන් නිර්මාණය වූ වැව්වල භාරකාරත්වය දරන ලද්දේ කුමන පදනමක් මත ද යන්න ශිලාලේඛන ප්‍රමුඛ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර සහ ලිඛිත මූලාශ්‍ර පදනම් කරගනිමින් අනුරාධපුර යුගයේ සිට යටත්විජිත අවධිය දක්වා අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ.

ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්ත ආශ්‍රිත නිළධාරීන් පත්වීම පරිපාලන වශයෙන් ඇතිවූ වෙනස්කම් පදනම් කරගෙන රාජ්‍යත්ව යුගය සහ බ්‍රිතාන්‍ය යුගය ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය. ශ්‍රී ලංකාවේ මුල්කාලීනව එනම් රාජ්‍යත්ව යුගයේදී වාපිය සම්බන්ධ නිළතල පරම්පරාවෙන් පරම්පරාවට හිමි වූ බව සහ බ්‍රිතාන්‍ය යුගයේදී ආඥා පනත්, ගිවිසුම් ආදිය හරහා පුද්ගලයින්ට පවරා දීම තුළින් ක්‍රියාවට නැංවූ බවත් හඳුනාගැනිණි. පරම්පරාගතව පැවති මෙම පත්වීම් මරණින් පසු පුතාට හෝ සහෝදරයාට හිමිවීම තුළින් ජීවිතාන්තය දක්වා ධූරය දරන තනතුරු බවට පත්ව පැවති අතර බ්‍රිතාන්‍ය පවරා දීම හරහා එය වර්ෂයකට හෝ වර්ෂ කිහිපයකට සීමා වීමක් දැකිය හැකිය. එනම් මුල් කාලයේ රාජ්‍ය යුගයේදී උරුමයේ සම්ප්‍රදායානුකූලව හිමි වූ වැව්වල නිළතලයන් බ්‍රිතාන්‍ය යුගයේදී පවරාදීම යන සංකල්පය තුළින් ක්‍රියාත්මක බව පැහැදිලි වේ. ඒ අනුව වාපී සංස්කෘතිය තුළ රාජ්‍ය නිළතලයන් පත්වීම ස්වභාවයන් දෙකකට කාලානුරූපීව සිදුවී ඇති බව පැහැදිලි වේ.

ප්‍රමුඛ පද : වාරි කර්මාන්ත, වාරි නිළධාරීන්, බ්‍රිතාන්‍ය යුගය